# ගොවි කටයුතු පුවත් හසුන

දෙවැනි හා තුන්වැනි කලාපය 2022



පුහුණු වැඩසටහන් 03,04
පර්යේෂණ අධ්‍යයන 06
මාධ්‍ය මෙහෙවර 05
විද්වත් දේශන 08

# ගොවි කටයුතු පුවත් හසුන

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය විසින් ප්‍රකාශයට පත් කරනු ලබන ත්‍රෛමාසික ප්‍රකාශනයකි. ගොවිකටයුතු ක්ෂේත්‍රයට අදාළ පර්යේෂණ හා ක්‍රියාකාරී වැඩසටහන්වල දී ලබා ගන්නා පර්යේෂණ තොරතුරු මෙමඟින් ප්‍රකාශයට පත් කෙරේ. ලබා ගත් මූලය සඳහන් කරමින් මෙහි ඇති කරුණු උපුටා ගත හැකිය.

**උපදේශකත්වය**

ආචාර්ය පී.පී. බන්දුල
අධ්‍යක්ෂ/ ප්‍රධාන විධායක නිලධාරී

**අධීක්ෂණය**

ශාන්ත හේවගේ
(තොරතුරු හා සන්නිවේදන අංශ ප්‍රධානී)

**සම්පාදනය හා පිටු සැකසුම**

නලන් අනුරුද්ධ
(විමර්ෂක)

**කවරයේ ඡායාරූපය**

පුබුදු නිරෝෂන්

**ගොවිකටයුතු පුවත් හසුන ප්‍රකාශනය, මුද්‍රණය සහ බෙදා හැරීම**

හෙක්ටර් කොබ්බෑකඩුව
ගොවිකටයුතු පර්යේෂණ හා
පුහුණු කිරීමේ ආයතනය


0112 696981

0112 692423

www.harti.gov.lk

facebook.com/hartilk

instagram.com/harti_lk

twitter.com/harti_lk




## නව අධ්‍යක්ෂතුමා වැඩභාර ගනී

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ නව අධ්‍යක්ෂ/ ප්‍රධාන විධායක නිලධාරී ලෙස ආචාර්ය පී.පී. බන්දුල මහතා පසුගිය සැප්තැම්බර් 21වන දින සිය රාජකාරී කටයුතු ආරම්භ කළේ ය.

2023 වර්ෂයේ පර්යේෂණ යෝජනා සැකසීම සඳහා කෘෂිකර්ම ක්ෂේත්‍රයට අදාළ පාර්ශවකරුවන් සමඟ පැවැත් වූ පළමු සාකච්ඡාව පසුගිය දා හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ අධ්‍යක්ෂ ආචාර්ය පී.පී. බන්දුල මහතාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වුණි.





# කෘෂි ව්‍යවසායක අවස්ථාවන් සම්බන්ධයෙන් ග්‍රාමීය කාන්තා සහ තරුණ ප්‍රජාව දැනුම්වත් කිරීම

ගොවිපල ආශ්‍රිතව සහ ගොවිපලෙන් බැහැරව ආරම්භ කළ හැකි කෘෂි ව්‍යවසායක අවස්ථාවන් සම්බන්ධයෙන් ග්‍රාමීය කාන්තා සහ තරුණ ප්‍රජාවන් දැනුවත් කිරීම සඳහා හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය මගින් සංවිධානය කරනු ලබන දැනුවත් කිරීමේ වැඩසටහන් මාලාව පසුගිය සැප්තැම්බර් මස 05වන දින සිට 16වන දින දක්වා කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා මධ්‍යස්ථාන කේන්ද්‍ර කර ගනිමින් පැවැත්විණි.

සාර්ථක කෘෂි ව්‍යවසායකයෙකු ලෙස ගොඩනැගීම සඳහා අවශ්‍ය දැනුම, ආකල්ප හා කුසලතා වර්ධනය කිරීම ඔස්සේ ග්‍රාමීය ප්‍රජාවන්ගේ ජීවනෝපාය සංවර්ධනය සඳහා දායක වෙමින් ග්‍රාමීය ආර්ථිකය ශක්තිමත් කිරීමට අත්වැලක් සැපයීම මෙම වැඩසටහන සංවිධානය කිරීමේ මූලික අරමුණයි. ව්‍යවසායකයෙකු ලෙස ගොඩනැගීම සඳහා ප්‍රගුණ කළ යුතු ගුණාංග, බෝග වගා ක්ෂේත්‍රයට සහ සත්ව නිෂපාදන ක්ෂේත්‍රයට අදාළව ආරම්භ කල හැකි නව ආකර්ෂණීය කෘෂි ව්‍යවසායක අවස්ථා හඳුනා ගැනීම සහ නවක ව්‍යවසායකයින් ලෙස ව්‍යාපාර සැලසුම් කිරීම සහ කළමනාකරණය සඳහා වැදගත් වන දැනුම, කුසලතා හා සහාය සේවා සමග සම්බන්ධ වීම ආදී තේමාවන් ගණනාවක් යටතේ සහභාගිවන්නන් දැනුවත් කිරීම මෙහි දී සිදුවිය.

ඉබ්බාගමුව, කුරුණෑගල, පොල්ගහවෙල, කුලියාපිටිය, කිතලව, ගල්ගමුව, රඹේ, පඬුවස්නුවර, නිකවැරටිය සහ වාරියපොල යන ගොවිජන සේවා මධ්‍යස්ථානයන් ආශ්‍රිතව පැවති මෙම වැඩසටහන සදහා ව්‍යවසායකත්වය උදෙසා උනන්දුවක් දක්වන නව ව්‍යවසායකයින් 350කට ආසන්න සංඛ්‍යාවක් සහභාගී විය.

මෙම වැඩසටහන සඳහා හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ අධ්‍යාපන හා පුහුණු අංශය, කුරුණෑගල දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය, වයඹ පළාත් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව සහ කාර්මික සංවර්ධන මණ්ඩලය - කුරුණෑගල දිස්ත්‍රික් කාර්යාලය මගින් සම්පත් දායකත්වය සපයන ලදී.





# ආහාර සුරක්ෂිතතාවය උදෙසා ප්‍රජාව දැනුවත් කෙරෙයි

ගෘහ ඒකකයන්හි ආහාර සුරක්ෂිතතාවය පවත්වාගෙන යාම පිළිබඳ ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන් රජය විසින් ක්‍රියාත්මක කෘෂිකාර්මික සංවර්ධන වැඩපිළිවෙලට අත්වැළක් වෙමින් ගෘහ ඒකකයන්හි ආහාර සුරක්ෂිතතාවය පවත්වාගෙන යාම පිළිබඳ ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන් මාලාවක් හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ අධ්‍යාපන හා පුහුණු අංශයේ නිළධාරීන්ගේ මූලිකත්වයෙන් සැප්තැම්බර් මස 05වන දින සිට දෙසතියක කාලයක් පුරා කෑගල්ල දිස්ත්‍රික්කයේ තෝරාගත් අර්ධ නාගරික ප්‍රදේශ 10ක් මූලික කොට ගනිමින් ක්‍රියාත්මක විය.

ගෘහ ඒකකයන් හි ආහාර සුරක්ෂිතතාවය පවත්වා ගැනීම උදෙසා අවශ්‍ය දැනුම, ආකල්ප හා කුසලතා අර්ධ නාගරික ප්‍රදේශයන්හි වෙසෙන ප්‍රජාව මූලික කර ගනිමින් වර්ධනය කිරීම මෙම වැඩසටහනෙහි මූලික අරමුණයි. මෙහි දී ආහාර නිෂ්පාදන ක්ෂේත්‍රය වර්තමානයේ මුහුණ දෙන අභියෝග සහ එම අභියෝග ජයගත හැකි මාර්ගයන්, ගෙවත්ත ආශ්‍රිත බෝග හා සත්ත්ව නිෂ්පාදන තුළින් ආහාර සුරක්ෂිතතාව ආහාර සුරක්ෂිතතාවය පවත්වාගෙන යාම ආදී තේමාවන් ඔස්සේ සහභාගි වූවන් දැනුවත් කිරීම සිදුවිය.

මෙම වැඩසටහන සඳහා මූලික සම්පත් දායකත්වය පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කෑගල්ල දිස්ත්‍රික් කාර්යාලය සහ කෑගල්ල ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ සෞඛ්‍ය අධ්‍යාපන සහ ප්‍රවර්ධන අංශය විසින් ලබාදුන් අතර අප ආයතනයේ අධ්‍යාපන හා පුහුණු අංශයේ නිලධාරීන්ට අමතරව, අදාළ ප්‍රදේශයන්හි කෘෂිකර්ම උපදේශකවරුන්, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ- දිස්ත්‍රික් විෂයභාර නිලධාරීන් සහ අදාළ ප්‍රදේශයන්හි සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන් අනෙකුත් සම්පත්දායකයින් ලෙස සම්බන්ධ විය.





හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ පර්යේෂණ නිලධාරීන් විසින් සිදුකරනු ලබන සමාජ - ආර්ථික පර්යේෂණවල සොයා ගැනීම්, නිර්දේශ හා යෝජනා වඩාත් පුළුල් ලෙස ගොවිජනතාව වෙත සන්නිවේදනය කිරීමේ මූලික අරමුණින් සහ ගොවිජනතාව වෙත කෘෂි තාක්ෂණය, ඒ හා සම්බන්ධ නව සොයා ගැනීම්, රාජ්‍ය ප්‍රතිපත්ති සන්නිවේදනය කිරීමේ අරමුණින් පසුගිය 2021 වසරේ නොවැම්බර් මස සිට “ගොවිමිණ කෘෂිකර්ම ජාතික පුවත්පත” ප්‍රකාශයට පත් කිරීම ආරම්භ කරන ලදි. මේ වනවිට එහි කලාප 06ක් මුද්‍රණය කොට ගොවි ජනතාව වෙත බෙදා හැර අවසන් කොට ඇත. පවතින අර්බුදකාරී වාතාවරණය යටතේ මුද්‍රණය සඳහා වැයවන ඉහළ පිරිවැය හේතුවෙන් එහි ඉදිරි කලාපයන් ගොවිමිණ ඊ - පුවත්පතක් ලෙස අන්තර්ජාලයට මුදා හැරීමට නියමිතය.




කෘෂිකර්මාන්තය හා සම්බන්ධ අන්තර් ආයතින පුවත්පතක් ලෙස මෙය ආරම්භ කළ අතර ඒ හේතුවෙන් කෘෂිකර්ම අමාත්‍යාංශයට අයත් සියලුම ආයතන සහ අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සහ අපනයන සංවර්ධන මණ්ඩලය ආදී ආයතනවල තොරතුරු ද ගොවි ජනතාව වෙත පුළුල්ව සන්නිවේදනය කිරීම මේ හරහා සිදුවිය.

100%ක් අනුග්‍රාහක දැන්වීම් වලින් උපයා ගන්නා ලද මුදලින් පුවත්පත මුද්‍රණය කිරීම හා බෙදා හැරීම සිදුවිය. ඒ අනුව සිව් වර්ණයෙන් පිටු 24ක ප්‍රධාන කොටස සහ පිටු 16ක “සාර” ටැබ්ලොයිඩ් අතිරේකය සමග මාසිකව පිටපත් 10,000ක් ගොවිමිණ පුවත්පත මුද්‍රණය කිරීමට අවස්ථාව උදාවිය. ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ දිවයිනේ ප්‍රධාන කෘෂිකාර්මික දිස්ත්‍රික්ක 09ක ගොවිජන මධ්‍යස්ථාන 176ක් ආවරණ වන පරිදි ගොවි සංවිධාන වෙත (එක් ගොවිජන මධ්‍යස්ථානයකට පිටපත් 50 බැගින්) සහ අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ගොවි සංවිධාන නායකයින් වෙත පිටපත් 2000ක් නොමිලේ බෙදා හැරීම සිදුවිය.




# HARTI YouTube

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය පර්යේෂණ සොයාගැනීම් වඩ වඩාත් ජනගත කිරීමේ අරමුණින් කෙටි වීඩියෝ සම්මුඛ සාකච්ඡා මාලාවක් නිෂ්පාදනය කරනු ලැබේ.

අප ආයතනයේ දැක්ම අනුව යමින් ගොවිජන හා ග්‍රාමීය අංශයේ තිරසාර කෘෂිකර්ම සංවර්ධනය සඳහා ජනනය කරන නව දැනුම පිළිබඳව ජනතාව සහ අදාළ සියලු පාර්ශවයන් දැනුවත් කිරීම මෙහි ප්‍රධාන අරමුණ වේ.

කෘෂිකාර්මික හා ගොවිජන ක්ෂේත්‍රයට අදාළ සමාජ, ආර්ථික පර්යේෂණ ක්‍රියාකාරකම්වල නිරත වන පිරිස, රජයේ සැලසුම් සහ ප්‍රතිපත්ති සම්පාදකයින්, පර්යේෂණ ප්‍රජාව, ගොවි ජනතාව මෙම වැඩ සටහනේ ඉලක්කගත කණ්ඩායම වේ.




# ඡායාරූප පුස්තකාලය

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය විසින් කෘෂිකර්මාන්තයට අදාළ සියලුම ඡායාරූප පහසුවෙන් ලබාගත හැකි මධ්‍යගත මධ්‍යස්ථානයක් ලෙස ඡායාරූප පුස්තකාලයක් ස්ථාපිත කරන ලදී. ඡායාරූප පුස්තකාලයක් යනු ඡායාරූප ගබඩා කිරීම, සංවිධානය කිරීම, කළමනාකරණය කිරීම සහ බෙදා හැරීම සඳහා ආරක්ෂිත, මධ්‍යගත ස්ථානයක් සඳහාවන යෙදුමකි. එය පරිශීලකයින්ට ඡායාරූප ගොනු ඉක්මනින් සහ පහසුවෙන් කළමනාකරණය කිරීමට, ප්‍රකාශනයට පත් කිරීමට සහ සංරක්ෂණය කිරීමට ඉඩ සලසයි.

ඡායාරූප පුස්තකාලය මඟින් පර්යේෂකයන්ට, අලෙවිකරුවන්ට, ඡායාරූප ශිල්පීන්ට සහ වෙනත් නිර්මාණකරුවන්ට ඩිජිටල් රූප ගොනු ඉක්මනින් සහ පහසුවෙන් සොයා ගැනීමට, සංවිධානය කිරීමට, සංස්කරණය කිරීමට සහ බෙදා ගැනීමට හැකියාව ලැබේ. එය අභ්‍යන්තරව හා බාහිරව කාලය ඉතිරි කර ගැනීමට, දෝෂ අවම කිරීමට, කාර්යක්ෂම හා ඵලදායී ලෙස සම්පත් භාවිතා කිරීමට සහ සහයෝගිතාව වැඩි දියුණු කිරීමට උපකාරී වේ.

දිවයිනේ විවිධ කෘෂි දේශගුණික කලාප යටතේ වගා කරනු ලබන බෝග නිෂ්පාදන හා සත්ත්ව පාලන කටයුතු, කෘෂි පාදක කර්මාන්ත හා කෘෂි නිෂ්පාදන සඳහා අගය එකතුකිරීම වැනි ක්ෂේත්‍රයන් මෙම ක්‍රියාකාරකම යටතේ ආවරණය කරනු ලැබේ. 2022 මැයි මස ආරම්භ කළ මෙම ක්‍රියාකාරකම හරහා ඡායාරූප 2500 කට අධික සංඛ්‍යාවක් රැස් කර ඇති අතර ඒවා වර්ගකිරීම, සංස්කරණය හා සංවිධානය කිරීම සිදුවෙමින් පවතී.

# පර්යේෂණ අධ්‍යයන

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය විසින් 2022 වර්ෂයට අදාළව සිදු කරන ලද පර්යේෂණ අධ්‍යයනයන් හා එහි අරමුණු පිළිබඳ සංක්ෂිප්ත සටහනක් පහතින් දක්වා ඇත.

### ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ දේශගුණික අවදානම් කණ්ඩායම්වල දේශගුණික අනුහුරුතාව සහ දේශගුණික අනුහුරු ගොවිතැන් පිළිවෙත් පිළිබඳ අධ්‍යයනය (WVL) සහ දේශගුණික කම්පනවලට ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික අංශයේ අවදානම අවම කිරීම සඳහා ඒකාබද්ධ ඊ-ව්‍යාප්ති සේවාවන් භාවිතා කිරීම පිළිබඳ අධ්‍යයනය (FAO)

දේශගුණික විපර්යාස ආශ්‍රිත උවදුරු සහ ස්වභාවික විපත්වලට ඔරොත්තු දීමේ හැකියාව සහ අනුහුරු වීමේ හැකියාව ශක්තිමත් කිරීම, දේශගුණික විපර්යාස වැළැක්වීමේ උපාය මාර්ග සහ සැලසුම් සැකසීම, දේශගුණික විපර්යාස අවම කිරීම, බලපෑම් අඩු කිරීම සහ පූර්ව අනතුරු ඇඟවීම පිළිබඳ අධ්‍යාපනය, කාන්තාවන්, තරුණයින් සහ ප්‍රාදේශීය සහ ආන්තික ප්‍රජාවන් කෙරෙහි අවධානය යොමු කිරීම ඇතුළුව ඵලදායී දේශගුණික විපර්යාස සම්බන්ධ සැලසුම් සහ කළමනාකරණය සඳහා ධාරිතාව ඉහළ නැංවීම සඳහා යාන්ත්‍රණ ප්‍රවර්ධනය කිරීම.

### වෙළඳපළ ක්‍රියාකාරීත්ව දර්ශකය සකස් කිරීම (WFP)

සංරචක නවයක් යටතේ වෙළඳපොළ ක්‍රියාකාරීත්වය විශ්ලේෂණය කිරීම, 2022 අගෝස්තු සිට 2022 දෙසැම්බර් දක්වා මාසිකව සකස් කළ දර්ශකය ප්‍රකාශයට පත් කිරීම.

### කෘෂිකාර්මික ව්‍යාප්ති පද්ධතියේ කාර්යක්ෂමතාව සහ ඵලදායිතාවය වැඩි කිරීම හා ජාතික කෘෂිකාර්මික ව්‍යාප්ති සේවයේ කාර්ය මණ්ඩල ධාරිතා වර්ධනය සඳහා වන දෙදින නේවාසික පුහුණු වැඩසටහන (FAO)

තිරසාර සංවර්ධනයක් උදෙසා ගොවි ප්‍රජාව මෙහෙයවීම සඳහා දැනුමින් යවත්කාලීන, කුසලතාවයෙන් හෙබි ඵලදායී කෘෂි ව්‍යාප්ති සේවාවක් තහවුරු කිරීම.

### ශ්‍රී ලංකාවේ පොහොර සහ අනෙකුත් කෘෂි රසායන සම්බන්ධ ප්‍රතිපත්ති වෙනස්වීම් හේතුවෙන් එළවළු වගාවට සිදුවී ඇති බලපෑම පිළිබඳ අධ්‍යයනය

වසර 2030 වන විට තිරසාර ආහාර නිෂ්පාදනයට සරිලන පරිදි නිෂ්පාදනය හා ඵලදායීතාවය වැඩි කිරීම සඳහා අවශ්‍ය තිරසාර කෘෂිකාර්මික ක්‍රමවල භාවිතාව, පරිසර පද්ධති නඩත්තුව, භූමි ඵලදායිතාවය ඉහළ නැංවීම, පාංශු සංරක්ෂණය ඇති කිරීම හා ගොවීන් සවිබල ගැන්වීම.

### ශ්‍රී ලංකාවේ පොහොර සහ අනෙකුත් කෘෂි රසායන සම්බන්ධ ප්‍රතිපත්ති වෙනස්වීම් හේතුවෙන් වී වගාවට සිදුවී ඇති බලපෑම පිළිබඳ අධ්‍යයනය

වසර 2030 වන විට තිරසාර ආහාර නිෂ්පාදනයට සරිලන පරිදි නිෂ්පාදනය හා ඵලදායීතාවය වැඩි කිරීම සඳහා අවශ්‍ය තිරසාර කෘෂිකාර්මික ක්‍රමවල භාවිතාව, පරිසර පද්ධති නඩත්තුව, භූමි ඵලදායිතාවය ඉහළ නැංවීම, පාංශු සංරක්ෂණය ඇති කිරීම හා ගොවීන් සවිබල ගැන්වීම.

### ශ්‍රී ලංකාවේ පොහොර සහ අනෙකුත් කෘෂි රසායන සම්බන්ධ ප්‍රතිපත්ති වෙනස්වීම් මගින් විසිතුරු මල් හා පැල නිෂ්පාදන කටයුතු කෙරෙහි සිදුවී ඇති බලපෑම පිළිබඳ අධ්‍යයනය

වසර 2030 වන විට තිරසාර ආහාර නිෂ්පාදනයට සරිලන පරිදි නිෂ්පාදනය හා ඵලදායීතාවය වැඩි කිරීම සඳහා අවශ්‍ය තිරසාර කෘෂිකාර්මික ක්‍රමවල භාවිතාව, පරිසර පද්ධති නඩත්තුව, භූමි ඵලදායිතාවය ඉහළ නැංවීම, පාංශු සංරක්ෂණය ඇති කිරීම හා ගොවීන් සවිබල ගැන්වීම.

### ආහාර ද්‍රව්‍යවල මිල ඉහළ යාම ගෘහ ඒකකයන්හි ආහාර සුරක්ෂිතතාව කෙරෙහි බලපාන ආකාරය පිළිබඳ අධ්‍යයනය

ආහාර ද්‍රව්‍යවල මිල ඉහළ යාම හේතුවෙන් ගෘහ ඒකක වල ආහාර සුරක්ෂිතතාව කෙරෙහි ඇති වූ බලපෑම තක්සේරු කිරීම, ආහාර අනාරක්ෂිත මට්ටමට පරිහරණය කිරීම සහ ආහාර අනාරක්ෂිතතාව අවම කිරීම සඳහා සුදුසු සමාජ ජාල ආරක්ෂණ ක්‍රම භාවිතා කිරීම.

### ග්‍රාමීය සංවර්ධනය සඳහා තිරසාර ජීවනෝපාය මාර්ගයක් ලෙස ආදායම විවිධාංගීකරණය: ප්‍රශස්ත තත්වයන් හඳුනාගැනීම

ආර්ථික අපහසුතා සහිත සහ අවදානමට ලක්විය හැකි තත්වයන් තුළ සිටින ප්‍රජාවන්ගේ ඔරොත්තු දීමේ හැකියාව ගොඩනැගීම සහ දේශගුණය හා සම්බන්ධ ආන්තික සිදුවීම් සහ අනෙකුත් ආර්ථික, සමාජීය සහ පරිසරයන්ට නිරාවරණය වීමේදී අවදානම අඩු කිරීම.

### මානව වනසත්ව ගැටලුවේ ස්වභාවය සහ ගොවිජන ප්‍රජාවට එහි බලපෑම

මෙම සමීක්ෂණයේ ප්‍රධාන අරමුණු වන්නේ, බෝග වගාවට සතුන්ගෙන් සිදුවන හානිය සහ එසේ හානිකරන සතුන් පිළිබඳ මූලික තොරතුරු රැස්කිරීමත්, වන සතුන්ගෙන් බෝග වගාවට වන බලපෑම පිළිබඳ මූලික තක්සේරුවක් සිදුකිරීමට අවශ්‍ය දත්ත හා තොරතුරු පදනමක් සැපයීම.

### ප්‍රතිපත්ති සංක්ෂිප්තය, තොරතුරු පොත් සහ පුවත්පත් ලිපි සකස් කිරීම

වෙළඳපොළ තොරතුරු එක්රැස් කිරීමේ හා බෙදාහැරීමේ ව්‍යාපෘතිය, කෘෂිකර්ම අමාත්‍යංශය, ආර්ථික මධ්‍යස්ථානවල සහ වෙළඳපළවල පවතින ආහාර ද්‍රව්‍යයන්හි එදිනෙදා මිල ගණන් ගොවි ජනතාව වෙත ජංගම දුරකථන ඔස්සේ ලබා දීම, (මොබිටෙල් ආයතනය හා එක්ව ක්‍රියාත්මක කරනු ලබන 6666 සේවාව මගින්) වෙළඳපළවල පවතින ආහාර ද්‍රව්‍යයන්හි එදිනෙදා මිල ගණන් මත පදනම්ව සතිපතා සහ මාස්පතා විවරණිකාවන් ප්‍රකාශයට පත්කිරීම.

# අවබෝධතා ගිවිසුම්

**හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය විසින් මෙරට කෘෂිකර්ම පර්යේෂණ ක්ෂේත්‍රයේ උන්නතිය උදෙසා අන්තර් ආයතනික ශාස්ත්‍රීය හා පර්යේෂණ සහයෝගීතාව වර්ධනය කිරීමේ අරමුණින් විශ්වවිද්‍යාල කෘෂිකර්ම පීඨයන් සමඟ අවබෝධතා ගිවිසුම් ගතවීමේ වැඩසටහනක් පසුගිය වසරේ අග භාගයේ දී ආරම්භ කෙරුණි. එමගින් ස්වකීය ආයතනික අරමුණු සාක්ෂාත් කරගැනීම උදෙසා දෙපාර්ශවය සතු දැනුම, සීමාවාසික අවස්ථා, අධ්‍යාපන වැඩසටහන් සහ පර්යේෂණ පුහුණු අවස්ථා වඩාත් පුළුල් සහ ඵලදායී ලෙස සහයෝගීතාවයෙන් යුතුව යොදා ගැනීම අපේක්ෂා කෙරෙයි.**



යාපනය විශ්වවිද්‍යාලයීය කෘෂිකර්ම පීඨය හා හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය අතර අන්‍යෝන්‍ය සහයෝගීතාව වර්ධනය කරගැනීම උදෙසා අවබෝධතා ගිවිසුමකට එළැඹීම පසුගිය අගෝස්තු මස 24වන දින එම විශ්වවිද්‍යාලයේ දී සිදු විය. ඒ යාපනය විශ්වවිද්‍යාලයේ උපකුලපති මහාචාර්ය එස්. ශ්‍රී. සත්කුනරාජා සහ හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ හිටපු අධ්‍යක්ෂ මාලින්ද සෙනෙවිරත්න යන මහත්වරුන්ගේ ප්‍රධානත්වයෙනි. මෙය හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය විසින් විශ්වවිද්‍යාල කෘෂිකර්ම පීඨයක් සමගින් අවබෝධතා ගිවිසුමකට එළැඹි හත්වැනි අවස්ථාව විය.



ශ්‍රී ලංකා නැගෙනහිර විශ්ව විද්‍යාලයේ කෘෂිකර්ම පීඨය සහ හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය අතර අධ්‍යයන සහ විද්‍යාත්මක ක්ෂේත්‍රයන්හි අන්‍යෝන්‍ය සහයෝගීතාව වර්ධන කිරීමේ අරමුණින් අවබෝධතා ගිවිසුමකට අත්සන් කිරීම පසුගිය අගෝස්තු මස 08 වන දින නැගෙනහිර විශ්ව විද්‍යාලයේ දී සිදුවිය. ඒ නැගෙනහිර විශ්වවිද්‍යාලයේ උපකුලපති මහාචාර්ය වී. කනගසිංහම් මහතා සහ හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ හිටපු අධ්‍යක්ෂ මලින්ද සෙනෙවිරත්න මහතාගේ ප්‍රධානත්වයෙනි.



හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය සහ වයඹ විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම හා වැවිලි පීඨය අතර අධ්‍යයන, විද්‍යාත්මක හා පර්යේෂණ වැඩසටහන් සඳහා වූ සහයෝගීතාව වර්ධනය කිරීමේ අරමුණින් අවබෝධතා ගිවිසුමකට අත්සන් කිරීම පසුගිය මාර්තු මස 29වන දින සිදුවිය. ඒ වයඹ විශ්වවිද්‍යාලයේ වැඩබලන උපකුලපති ආචාර්ය සංජීව බෝවත්ත මහතාගේ සහ හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ හිටපු අධ්‍යක්ෂ මාලින්ද සෙනෙවිරත්න මහතාගේ ප්‍රධානත්වයෙනි.

# විද්වත් දේශන



2022 වර්ෂයේ ජුනි මාසයේ සිට එක් එක් මාතෘකා ඔස්සේ විද්වත් දේශන පැවැත්වීමේ වැඩසටහනක් හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය විසින් සංවිධානය කරන ලදී. පහත දැක්වෙනුයේ මේ දක්වා පවත්වන ලද දේශන සඳහා සහභාගී වූ විද්වතුන් හා ඔවුන් විසින් සාකච්ඡාවට ලක් කළ මාතෘකාවන් ය.

**Topic** - Vignettes of Sri Lanka's Economic Crisis and Path to Recovery |**Speaker** - Dr. Vagisha Gunasekara (Senior Economics at the UNDP)

**Topic** - Positioning Sri Lanka as a Prominent Hub for Innovative Products and Services | **Speaker** - Mrs. Indira Malwatte (Former Chairperson, EDB)

**Topic** - Radical thoughts of G.V.D. de Silva : Country, City, Communism |**Speaker** - Prof. Kanishka Goonewardena (Professor of Geography and Planning, University of Toronto)


**Topic** - Digital Agri food Ecosystems: A Modular Path for Sri Lanka To Achieve Food Security | **Speaker** - Prof. Athula Ginige (Professor in Information Technology, Western Sydney University, Australia)

5. **Topic** - Pricing Nature - Using Economic Valuation Methods To Agri - Environment Policies| **Speaker** - Dr. Sahan T.M. Dissanayake (Addociate Professor in Economics, Portland State University, USA)

6. **Topic** - Discourse of Research and Policy for Restructuring Rural Agrariam Sector| **Speaker** - Dr. Upul Aberathna (Professor in Political Science/ Public Policy University of Peradeniya)




ජාතික කෘෂිකර්ම ව්‍යාප්ති පද්ධතියේ ධාරිතා වර්ධනය පිළිබඳ පුහුණු වැඩසටහන පසුගිය ජූලි මස 14 සහ 15 දෙදින පුරා පේරාදෙණිය ගන්නෝරුව ජාතික කෘෂිකර්ම තොරතුරු හා සන්නිවේදන මධ්‍යස්ථානයේදී පැවැත්විණි. අලෙවිකරණය සහ අගය එකතු කිරීම සම්බන්ධයෙන් නව සංකල්ප සහ තාක්ෂණයන් පිළිබඳව මධ්‍යම රජයට සහ පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවලට අනුයුක්ත ව්‍යාප්ත කළමණාකරුවන් හා භෝග නිෂ්පාදන අංශයන් දැනුවත් කිරීම තුළින් ඔවුන් සවිබල ගැන්වීම මෙම දෙදින පුහුණු වැඩසටහනේ මූලික අරමුණයි.



දෙමුහුන් ආකෘතියෙන් පවත්වන ලද මෙම වැඩසටහන සඳහා ජාතික කෘෂිකාර්මික පාසල්වල සහකාර අධ්‍යක්ෂවරුන්, විදුහල්පතිවරුන් හා ආචාර්ය මණ්ඩලය සහ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සේවාස්ථ පුහුණු මධ්‍යස්ථානවලට අනුයුක්ත පුහුණු නිලධාරීන් Zoom තාක්ෂණය ඔස්සේ ද සම්බන්ධ විය.

කෘෂිකර්ම අමාත්‍යාංශයේ සහ එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ මගපෙන්වීම සහ මූල්‍ය ආධාර මත හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු ආයතනය සහ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානය එක්ව මෙම වැඩසටහන සංවිධානය කරන ලදී.